**ශීර්ෂය 222 - ශ්‍රී ලංකා යුද්ධ හමුදාව**

------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 17 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| **1.6.1 (ඇ)** | යුද්ධ හමුදාව සතු ඉඩම් කොටස් 160 ක ප්‍රමාණයක් මෙතෙක් තක්සේරු කර ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි. | යුද්ධ හමුදාව සතු ඉඩම් කඩිනමින් හඳුනාගෙන තක්සේරු කර ගිණුම් ගත කල යුතු වීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඒසීඒ-6 ආකෘතියේ තොරතුරු අනුව යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු.බිලියන 1.51 ක් වූ අතර, ඒසීඒ 2(i) ආකෘතිය යටතේ මූලධන වියදම් වශයෙන් එකතුව රු.බිලියන 2.03 ක් දක්වා තිබුණි. ඒ අනුව රු.බිලියන 0.52 ක වෙනසක් පැවතුණු අතර, මෙම වෙනස්කම් සඳහා හේතු ගිණුම් සටහන් මඟින් හෙළිදරව්ද, කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් සංචලන වර්තාව උපචිත පදනම මත පිළියෙල කරන නමුත් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මුදල් පදනම මත පිළියෙල කර ඇති බව. | අදාල සංඛ්‍යා නොසැසඳීමට හේතුව මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |

### 1.6.2 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) පහත සඳහන් වත්කම් ඇතුලත් කර නොතිබුණු අතර, එම නිසා යුද්ධ හමුදාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේද මෙම වත්කම්වල වටිනාකම ඇතුලත්ව නොතිබුණි. | | |
| (i) යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන බිම් කැබලි 619 කට අයත් අක්කර 22,640 ක වටිනාකම | යුද්ධ හමුදාවට අයත් බිම් කැබලි 258 කට අදාල අක්කර 11,293 ක ඉඩම් සම්බන්ධව ආරක්ෂක | යුද්ධ හමුදාවට අයිති ඉඩම් ප්‍රමාණය තක්සේරු කර ගිණුම් ගත කළයුතු අතර, |

| | | |
|---|---|---|
| | අමාත්‍යාංශය හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති අතර, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් අදාල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුකර දෙන ලෙස ඉල්ලුම්කර ඇත. එම තක්සේරු අගයන් ලැබීමෙන් අනතුරුව ඉඩම් ලේඛනගත කිරීමට කටයුතු කරනු ලබන අතර බිම් කැබලි 361 කට අයත් එකතුව අක්කර 11,347 ක් පවරා ගැනීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව. | දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් පවතින ඉඩම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහනක් ලෙස හෝ අනාවරණය කළයුතු වීම. |
| (ii) රු.බිලියන 77.03 ක ගොඩනැගිලි වටිනාකම | යුද්ධ හමුදාව සතු ගොඩනැගිලි 8,123 ක රු.112,651,224,399 ක වටිනාකම යුද්ධ හමුදාව පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ජාලගත පරිගණක පද්ධතිය වෙත මේ වනවිට ඇතුළත්කර ඇති අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වෙත ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව. | යුද්ධ හමුදාවට අයිති ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කළයුතු වීම. |
| (iii) රු.බිලියන 13.71 ක් වටිනා වාහන | යුද්ධ හමුදාව සතු සියළුම වාහන පිළිබඳ දත්ත මූල්‍ය ප්‍රකාශන වාර්තාව වෙත සහ ස්ථාවර වත්කම් ලේඛනයෙහි යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. | යුද්ධ හමුදාවට අයිති වාහනවල වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම. |
| **(iv)** 2019 වර්ෂයේ අවසානයට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ප්‍රවාහන උපකරණ ලෙස දක්වා තිබුණු රු.මිලියන 111.22 ක ස්ථාවර වත්කම් | 2016 වර්ෂය සඳහා සකස්කර ඇති මූල්‍ය ප්‍රකාශන වාර්තාව අනුව ස්ථාවර වත්කම් ජාලගත පරිගණක පද්ධතියෙහි | වර්ෂ ආරම්භ ශේෂයට අවශ්‍ය ගැලපීම් සිදුකර වර්ෂ අවසාන ශේෂයන් මූල්‍ය ප්‍රකාශන මඟින් |

| | | | |
|---|---|---|---|
| | | ඇතුළත් පාපැදි රු.මිලියන 111.22ක වටිනාකමක් සඳහන්කර ඇති බව. | අනාවරණය කළයුතු වීම. |
| | **(v)** වැය විෂය අංක 222-01-01-2003 යටතේ දරන ලද යුද්ධ හමුදාවේ වාහන සඳහා වූ රු.මිලියන 153.5 ක ප්‍රාග්ධන වැඩි දියුණු කිරීම් | මූලධන ස්වරූපයේ අළුත්වැඩියා සිදුකිරීම හේතුවෙන් වත්කම් ලේඛනයේ අදාල වත්කමෙහි වටිනාකම සංශෝධනයක් සිදුනොකරනු ලබන බව. | වාහන වලට සිදුකරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ වැඩිදියුණු කිරීම් ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළයුතු වීම. |
| | (vi) ඉදිකිරීම් වර්ග අටකට අදාලව රු.බිලියන 1.09 ක නොනිම් වැඩ සමාලෝචිත වර්ෂය අවසානයට නිම වී තිබුණද, ඒවායේ වටිනාකම් | ගිණුම්ගත නොවූ රු.1,092,840,481ක වටිනාකම ප්‍රාග්ධනිත කර ගොඩනැගිලි වටිනාකම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙහි සඳහන් කිරීමට කටයුතු කරනු ලබන බව. | සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ නිමකරන ලද නොනිම් වැඩ, ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළයුතු වීම. |
| | **(**vii) රු.මිලියන 492.43 ක නොනිම් වැඩ | යුද්ධ හමුදාවේ ඉදිකිරීම් කටයුතු දිවයින පුරා ස්ථාපිතකර ඇති යුද්ධ හමුදා කඳවුරු තුළ සිදුකරමින් පවතින බැවින් එම ඉදිකිරීම් එකිනෙක ගෘහ නිර්මාණ ශිල්පීන් විසින් සහතික කරගැනීමට ඇති අපහසුව මෙම තත්ත්වයට හේතු වී ඇති බව. | වර්ෂ අවසාන නොනිම් වැඩ පිරිවැය ගිණුම්ගත කිරීමේදී, ගෘහනිර්මාණ ශිල්පියා විසින් සහතික කළ වැඩවල පිරිවැය ගිණුම්ගත කළයුතු විම. |
| | (viii) රාගම මූලික යුධ උපකරණ ගබඩාවට මිලදී ගෙන තිබුණු රු.මිලියන 4.35 ක ප්‍රාග්ධන භාණ්ඩ | ඉදිරි මූල්‍ය ප්‍රකාශන වාර්තාව සකස් කිරීමේදි තොග ගබඩා සතුව පවතින තොග වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලබන බව**.** | ගබඩාවල ඇති ප්‍රාග්ධන වත්කම්වල වටිනාකම් ප්‍රාග්ධනිතකර, මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවට රු.මිලියන 6.19 ක වියදමින් සුනඛයින් හා ඒ ආශ්‍රිත ජීව විද්‍යාත්මක වත්කම් මිලදී ගෙන තිබුණු නමුත්**,** මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර තිබුණේ රු.මිලියන 2.65 ක් පමණක් වන අතර**,** ඒ අනුව රු.මිලියන 3.54 ක වටිනාකමක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරිපත්කර ඇති බිල්පත් පෙර වර්ෂයට අදාල වත්කම් මිලදීගැනීමක් වන බැවින් මෙම මූල්‍ය වර්ෂයට ගිණුම්ගතකර නොමැති බව. | සමාලෝචිත වර්ෂයේ මිලදීගත් සම්පූර්ණ ප්‍රාග්ධන වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භෞතිකව හෝ ලේඛනගතව නොතිබුණු රු.මිලියන 1,044.25 ක පළතුරු වතු ශේෂයක් හා වේයන්ගොඩ රෙදිපිළි ගබඩාවට මිලදී ගන්නා ලද රු.මිලියන 159.63 ක විවිධ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයක් ප්‍රාග්ධනිත කර තිබුණු අතර, එම නිසා මෙම වත්කම් වල වටිනාකමින් ශුද්ධ වත්කම් අධිගණනය වී තිබුණි | පළතුරු වතු ද්වි ගණනයක් වී ඇති අතර, ප්‍රමාද දෝෂයකින් වැය විෂයන් මාරු වීමෙන් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගයක් ප්‍රාග්ධනිත වී ඇති බව. | යුද්ධ හමුදාවට අයිති ප්‍රාග්ධන වත්කම් පමණක් ප්‍රාග්ධනිත කළයුතු වීම. |
| (ඈ) | වත්කම් අපහරණයන් ගිණුම්ගත කිරීමේදී වත්කම්වල පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීම වෙනුවට එම වත්කම් අලෙවියෙන් ඉපයූ මුදල වන එකතුව රු.මිලියන 35.83 ක් අදාල වත්කම්වල ශේෂයන්ගෙන් ඉවත් කර තිබුණි. | අපහරණය කල වත්කම්වලට අදාල අත්පත්කරගත් පිරිවැය 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | වත්කම් අපහරණයෙන් ඉපයූ ආදායම නොව අදාල වත්කම් අත්පත් කර ගැනීමේ පිරිවැය හෝ තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කළ යුතු වීම. |
| (ඉ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් හා මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ-6) සැසඳීමේදී පහත නොසැසඳීම් නිරීක්ෂණය විය. | | |
| | (i) ස්ථාවර වත්කම් වර්ග 14 ක මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂයන්ගේ එකතුවට හා පරිගණක මුද්‍රිත සටහන්වල ආරම්භක ශේෂයන්ගේ එකතුව අතර රු.බිලියන 36.14 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ස්ථාවර වත්කම් වර්ග 10 ක භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල ආරම්භක ශේෂයන්ගේ එකතුව හා මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ආරම්භක ශේෂයන්ගේ එකතුව අතර රු.බිලියන 42.74 ක වෙනසක් පැවතුණි. එසේම, ස්ථාවර වත්කම් වර්ග 26 කට අදාළව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව වටිනාකම ලෙස රු.බිලියන 3.35 ක ආරම්භක ශේෂයක් දක්වා තිබුණද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එම වත්කම්වලට අදාලව එවැනි ශේෂයන් දක්වා නොතිබුණි. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය මඟින් ස්ථාවර වත්කම් 22 කට අදාල එකතුව රු.බිලියන 25.63 ක ආරම්භක ශේෂ පැවති බව වාර්තා කර තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එවැනි ශේෂයන් දක්වා නොතිබුණි. | යුධ හමුදාව මුදල් ගෙවීම් පදනම් කරගෙන මිලදීගැනීම් CIGAS පරිගණක පද්ධතිය වෙත ඇතුළත්කරන බැවින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ ආරම්භක ශේෂයන් සහ CIGAS පරිගණක පද්ධතිය වෙත ඇතුළත්කර ඇති වත්කම්වල ආරම්භක ශේෂ සමාන නොවීමට හේතුවී ඇති බව. | වෙනස්කම් හඳුනාගෙන ශේෂයන් ගැලපීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | ස්ථාවර වත්කම් වර්ග 10 ක භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව මිලදී ගැනීම්වල එකතුව සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වූ එම වත්කම්වලට අදාලව මිලදී ගැනීම්වල එකතුව අතර රු.මිලියන 678.23 ක වෙනසක් පැවතුණි. තවද, ස්ථාවර වත්කම් වර්ග 33 ක භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එකතුව රු.මිලියන 1.04 ක වත්කම් මිලදී ගත් බව සඳහන් කර තිබුණද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ එවැනි වත්කම් මිලදී ගත් බවට හෙළිදරවු කර නොතිබුණි. මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් වර්ග 21 කට අදාළව එකතුව රු.මිලියන 636.33 ක මිලදී ගැනීම් පැවරු බව දක්වා තිබුණද, එම වත්කම්වලට අදාල භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එවැනි වත්කම් මිලදී ගැනීම් නොවීය. | උපචිත පදනම මත සකසා ඇති සංචලන වාර්තාව හා මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් පදනම මත සකසා ඇති මූල්‍ය ප්‍රකාශන අතර,ශේෂ වල වෙනසක් පවතින බව . | වෙනස්කම් හඳුනාගෙන ශේෂයන් ගැලපීමට කටයුතු කළයුතු වීම. |
| (iii) | ස්ථාවර වත්කම් වර්ග 04 ක භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව දක්වා තිබුණු අපහරණ වත්කම්වල වටිනාකම් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.මිලියන 320.81 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ස්ථාවර වත්කම් වර්ග 12 ක් සඳහා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එකතුව රු.බිලියන 16.74 ක අපහරණයන් දක්වා ඇතත්, එම අපහරණයන් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. එසේම, ස්ථාවර වත්කම් වර්ග 05 ක භාණ්ඩාගාර පරිගණක සටහන් අනුව අපහරණයන් දක්වා නොතිබුණත්, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.මිලියන 4.38 ක අපහරණ වටිනාකම් දක්වා තිබුණි. තවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ රු.මිලියන 17.44 ක කෘෂිකාර්මික වාහන අපහරණ වටිනාකමක් අනාවරණය කර තිබුණු අතර, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මෙවැනි වත්කම් අපහරණය කර නොතිබුණි. | පරීක්ෂා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරනු ලබන බව. | වෙනස්කම් හඳුනාගෙන ශේෂයන් ගැලපීමට කටයුතු කළයුතු වීම. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව හෝ මු.රෙ 502(2) ප්‍රකාර එහි II වැනි පරිශිෂ්ඨය පරිදි ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගෙන යා යුතු වුවද, වර්ග අඩි

2,313,614 කට අයත් රු.බිලියන 80.46 ක් වටිනා ගොඩනැගිලි 1,049 ක් සහ රු.බිලියන 6.58 ක කාර්යාල උපකරණ, සන්නිවේදන උපකරණ හා වෙනත් උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයක ඇතුලත් කර නොතිබුණි. තවද, යුධ හමුදාවට අයිති හා දීර්ඝ කාලක සිට පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 258 කට අදාල අක්කර 11,293 ක ඉඩම් ලේඛනයක සටහන් කර තිබුණද, ඉහත විධිවිධාන ප්‍රකාරව විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක විස්තර ඇතුලත් කර නොතිබුණි.

### 1.6.4 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනුව සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආරක්ෂක උපකරණ, ගෘහභාණ්ඩ, පරිගණක උපකරණ හා මෘදුකාංග, ගිනි නිවීමේ උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ, පොදු භාණ්ඩ, ක්‍රීඩා උපකරණ, බෝට්ටු හා වෙනත් වත්කම් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) ගිණුමගත වී ඇති වටිනාකම රු.බිලියන 16.05 ක් වූ අතර, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එම වත්කම්වල වටිනාකම රු. බිලියන 23.05 ක් වූයෙන්, රු.බිලියන 7 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස්කම් වලට හේතු විගණනයට අනාවරණය නොකෙරුණි. | යුද්ධ හමුදා වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශන වාර්තාවෙහි ඇතුළත් එක් එක් වත්කම් කාණ්ඩ යටතේ ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | අදාල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාල විස්තර ලබාගත යුතු අතර, එම විස්තරවලට අනුව ගිණුම්වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වැය විෂය 222-01-01-2509-001 යටතේ ආදායම් උපයනු ලබන වාණිජ ව්‍යාපෘති (වෙනත්) සඳහා සලසා තිබුණු රු. මිලියන 1.37 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | 2020 වර්ෂය වෙනුවෙන් අවස්ථා 02 කදී ආදායම් උපදවන වාණිජ ව්‍යාපෘති (222-01-1-1-2509) වැය ශීර්ෂය සඳහා රු.1,370,000 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇති බව. | ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 12 ක් සඳහා එකතුව රු.බිලියන 6.29 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලයන 800.4 ක ප්‍රතිපාදනද, මූලධන වැය විෂයන් 12 ක් සඳහා එකතුව රු.බිලියන 2.11 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු. මිලියන 509.13 ක ප්‍රතිපාදනද උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරි කිරීම් ප්‍රමාණය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 සිට සියයට 79 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | අවසන් මාස 4 ක කාලය සඳහා වෙන්කල ප්‍රතිපාදන වලින් ප්‍රසම්පාදන කටයුතු සීමා වීම හා ආනයන සීමා කිරීම හේතුවෙන් වර්ෂය තුළ ප්‍රසම්පාදන කටයුතු සීමා වීමෙන් අදාල වැය විෂයන් තුළ ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව. | - එම - |
| (ඇ) | පුනරාවර්තන වැය විෂයන් හයකට සහ මූලධන වැය විෂයන් තුනකට සලසා තිබු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ. 66 යටතේ පිළිවෙලින් රු.මිලියන 680.23ක් සහ රු.මිලියන 210 ක් වෙනත් වැය විෂයන්වලින් මාරුකරගෙන තිබුණු අතර, එක් පුනරාවර්තන වැය විෂයකට රු.බිලියනය 01 ක්ද, ප්‍රාග්ධන වැය විෂයන් දෙකකට රු, මිලියන 30.5 ක් ද වශයෙන් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ද සලසා ගැනීමට සිදුවී තිබුණි. | වර්ෂය අවසානයේදී බැදීම් ආවරණය කරගැනීම සඳහා මු.රෙ. 66 වීරමොං ක්‍රියාපටිපාටිය මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කරන ලද බව. | - එම - |
| (ඈ) | පුනරාවර්ථන වැය විෂයන් නමයක් සහ එක් ප්‍රාග්ධන වැය විෂයකට මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූයෙන් එය ඉක්මවා වර්ෂය අවසානයට රු.බිලියන 7.01 ක බැරකම් සඳහා බැදීමට සිදු වී තිබුණි. | භාණ්ඩාගාරය විසින් බැඳීම් ආවරණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසාදී නොතිබුණු බව. | - එම - |
| (ඉ) | අංක 222-01-01-2104-009 දරන වැය විෂය යටතේ බෲඩ් හවුස් යුධ හමුදා කදවුර තුළ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 10.5 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 7.05 ක් හෙවත් සියට 67 ක් වර්ෂය අවසානයේ ඉතිරිකර තිබුණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අදාල සැපයුම්කරුවන් ඇණවුම් සම්පූර්ණ නොකිරීම සහ ද්‍රවශීල මුදල් නොලැබීම හේතුවෙන් මෙම තත්ත්වය හට ගෙන ඇති බව. | වියදම් දැරීම කළහැකි වීම සහ අත්‍යාවශය කරුණු සඳහා පමණක් පරිපූරක ඇස්තමේන්තු මගින් අරමුදල් ලබා ගත යුතු විම. |
| (ඊ) | අංක 222-01-02-1409 දරන සේවා (වෙනත්) වැය විෂයට මු.රෙ 66 මාරු කිරීම් යටතේ වෙනත් වැය විෂයන් දෙකකින් රු.මිලියන 50 ක් මාරු කර | බිල්පත් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීල මුදල් නොලැබීමෙන් අදාල ප්‍රතිපාදනයන් ඉතිරි වී ඇති බව. | මු.රෙ 66 යටතේ මාරුකරගත් ප්‍රතිපාදන උපයෝජනය කළයුතු වීම. |

ගෙන තිබුණු අතර, එම මාරු කර ගත් සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි.

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 15කට අදාලව රු.මිලියන 468.28 ක බැරකම්, මූලා‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි. | විගණන අංශය විසින් නොගෙවූ බිල්පත් විස්තර ලබා ගැනීම නිසා ශේෂ අතර පරස්පරතාවයක් හටගෙන ඇති බව. | බැරකම් මූලා‍ය ප්‍රකාශන වලින් අනාවරණය කළයුතු වීම. |
| (ආ) | මු.රෙ 94 (2) හා (3) යටතට නොගැනෙන වැය විෂයන් දෙකක එකතුව රු.මිලියන 6.02 ක බැරකම් මූලා‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර තිබුණි. | - එම - | යුද්ධ හමුදාව විසින් ඇති කරගත් බැරකම් හා මුදල් රෙගුලාසි යටතේ දක්වා ඇති බැරකම් පමණක් මූලා‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම. |
| (ඇ) | මුදල් රෙගුලසි 94(1) හා 214 ප්‍රකාරව පනවා ඇති නියමයන් අනුව කටයුතු නොකිරීම නිසා මාස දෙකට වැඩි බැරකම් අයිතම 395 ක් වූ අතර, එහි වටිනාකම රු. මිලියන 50.83 ක් විය. | 2020.10.31 දක්වා ලැබුණු බිල්පත් නිරවුල් කිරීම සඳහා පමණක් මුදල් භාණ්ඩාගාර වෙතින් නිදහස්කර තිබුණු බව. | බැරකම් කඩිනමින් බේරුම් කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඈ) | මූලා‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුළත් පුද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු මිලියන 30.34 ක බැරකම් එම ආයතනය සනාථ කර නොතිබුණි. | 2020.12.31 දින වන විට යුද්ධ හමුදාව වෙත සමහර බිල්පත් නොලැබීම නිසා ශේෂ අතර වෙනසක් පැවතිය හැකි බව. | ශේෂ අතර වෙනස්කම්වලට හේතු නිශ්චිතව සොයා ගෙන නිවැරදි කිරීම් කඩිනමින් කළයුතු වීම. |

**2.3 වෙනත් දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් දෙපාර්තමේන්තු සඳහා වැය විෂයන් හතකට | කොවිඩ් 19 වසංගත | වෙනත් දෙපාර්තමේන්තු |

| | | |
|---|---|---|
| අදාලව වෙන්කර තිබුණු රු.මිලියන 597.08 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 356.87 ක් පමණක් වියදම් කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 240.21 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, මෙම ඉතිරිකිරීම් ප්‍රතිශතය සියයට 4 සිට සියයට 79 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | තත්ත්වය නිසා මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව. | විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කළයුතු වීම. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| **(අ)** | වර්ෂය ඉක්ම වූ වර්ෂ 30 දක්වා කාල පරාසයක් තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරින් 3,995 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරින් 462 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 46.06 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4.3 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අය කර ගෙන නොතිබුණි. මෙම ණය ශේෂ වලින් රු.මිලියන 5 ක් වර්ෂ 10 ත් 30 ත් අතර ණය ශේෂ වේ. | මෙම ණය ශේෂයන් අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මෙම ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වීම. |
| **(ආ)** | විශ්‍රාම ගිය හමුදා නිලධාරින් 25 දෙනෙකුගේ සහ සිවිල් නිලධාරින් 71 දෙනෙකුගෙන් වර්ෂය ඉක්මවූ වර්ෂ 15 දක්වා කාල පරාසයක් තුළදී අය නොවූ ණය ශේෂ වල එකතුව රු.මිලියන 5.35 ක් වූ අතර, ආයතන සංග්‍රහය **xxiv** පරිච්ඡේදයේ 4.2 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණයශේෂ අයකර ගෙන නොතිබුණි. | - එම - | - එම - |
| **(ඇ)** | මියගිය හමුදා නිලධාරින් 31 දෙනෙකුගේ සහ මියගිය සිවිල් නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු.මිලියන 1.42 ක් වූ අතර, ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මෙම ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | - එම - | - එම - |
| **(ඈ)** | වැඩ තහනම් කර ඇති සිවිල් නිලධාරින් 7 දෙනෙකුගේ වර්ෂ 2 සිට 7 දක්වා කාල පරාසයක් තුළ අයවීමට ඇති ණය ශේෂයන්ගේ එකතුව රු. 173,436 ක් විය. | - එම - | - එම - |

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i)** | **මුදල් රෙගුලාසි 104 (3)(4)** | 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සිදු වී තිබුණු රිය අනතුරු 128 ක් සඳහා ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. තවද, රිය අනතුරු 197 ක් සඳහා පරිපූර්ණ වාර්තාද ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී ලබා දීමට කටයුතු කරනු ලබන බව. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| **(ii)** | **මුදල් රෙගුලාසි 715 (1) (ඉ), 715 (2) හා 751 (1)** | 2021 ජනවාරි 01 දින සිට 2021 පෙබරවාරි 05 දින දක්වා කොස්ගම විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල ගබඩාවට ලැබුණු හා නිකුත් කල භාණ්ඩ වර්ග 1,900 කට අධික ප්‍රමාණයක භාණ්ඩ අයිතම විශාල සංඛ්‍යාවක ලැබීම් හා නිකුත් කිරීම් එම එක් එක් භාණ්ඩ වර්ග සඳහා පවත්වා ගෙන යන ගබඩා බින් කාඩ්වලට ඇතුළත් කර නොතිබුණි. | මේ වන විට බින්කාඩ්පත්වල සටහන්කර යාවත්කාලීන කර ඇති බව. | අදාල මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය** | යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන වාහන 7,127 කට අදාලව සමාලෝචිත වර්ෂයේ හෝ පෙර වර්ෂවල ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර, ප්‍රවාහන අංශය විසින් තීරණය කරණු ලබන ඉන්ධන දහනයවීම් ප්‍රමාණයන් අනුව ධාවන සටහන්/ප්‍රවාහන ගමන් බලපත්‍රවල ඉන්ධන තුළනය කිරීම් සිදු කර තිබුණි. | යුද්ධ හමුදාවේ රාජකාරි සඳහා යොදාගනු ලබන වාහනයන්හි වර්ෂයක් පාසාම ඉන්ධන කාර්යක්ෂමතාවය පිළිබඳ පරීක්ෂාවක් සිදු නොකරනු ලබන බව. | අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.6 අග්‍රිම ලැබීම්**

-------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදාව විසින් මහා භාණ්ඩාගාරයෙන් එකතුව රු.මිලියන 197,978.3 අග්‍රිම ඉල්ලුම් කර තිබුණුද, මුදලින් ලැබී තිබුණු මුළු අග්‍රිම වටිනාකම රු.මිලියන 189,399.9 වූයෙන් අනුමත සීමාවෙන් රු.මිලියන 8,578.4 ක් හෙවත් සියයට 4.3ක ප්‍රමාණයක් ලැබී නොතිබුණි. | සෑම මාසයකම ඊට පෙර මාසයේ අවසාන දිනට පවතින හිඟ බිල්පත් වටිනාකම මහා භාණ්ඩාගාරයට දැණුම්දී ඇති බව. | අක්මුදල් අවශ්‍යතාවය හා හිඟ බිල්පත් වටිනාකම මහා භාණ්ඩාගාරයට කල්වෙලා ඇතිව ඉදිරිපත් කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 සැලැසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යුද්ධ හමුදාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය වර්ෂයේ මුල් මාස හතර සඳහා පමණක් සීමා කර තිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශය කළ ඉල්ලීමකට අනුව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරි සැලසුම් සකස් කිරීමට අවධානය යොමු වියයුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ------------------------------------ | ---------- |
| (අ) | වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.බිලියන 29.74 ක ඇස්තමේන්තුගත පිරිවැයක් යටතේ පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රසම්පාදනය කර ගන්නා භාණ්ඩ හෝ සේවා ඒකක ප්‍රමාණයන් දක්වා නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සෑම වර්ෂයකම සකස්කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සැලසුම් සකස්කළ යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදා ප්‍රධාන සැපයුම් ඒකක සඳහා මාළු මිලදී ගැනීම සම්බන්ධව සිදු කළ විගණන නියදි පරීක්ෂාවේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකර අවස්ථා 11 කදී රු.මිලියන 2.26 ක වටිනා මාළු වර්ගයන් කි.ග්‍රෑ 3,119 ක් ආදේශක නොවන සලාක ද්‍රව්‍ය ලෙස සපයා තිබුණි. 2020 ජනවාරි මාසයේ පමණක් සැපයුම්කරුවන් විසින් රු.896,886 ක් වටිනා මාළු කි.ග්‍රෑ 962 කට අදාලව ආදේශකයන්ද නොසැපයූ අවස්ථා 38 ක් නිරීක්ෂණය වූ අතර, නිර්දේශිත සියයට 50 ක සීමාව ඉක්මවා රු.මිලියන 2.82 ක මාළු කි.ග්‍රෑ 4,162 ක් ආදේශක වශයෙන් සපයා තිබුණි. | භට පිරිස් වෙත ආහාරපාන ලබාදීම සඳහා අනුමත සැපයුම්කරුවන් විසින් නිසි පරිදි මාළු සැපයුම් සිදු නොකරනු ලබන අවස්ථාවන්හිදී නියමිත කැලරි ප්‍රමාණය ආරක්ෂා වන පරිදි කටයුතු කරන අතර, ප්‍රසම්පාදන ලේඛනයේ සඳහන් උපදෙස් පරිදි අඩු මිලට බිල්පත් සකස් කිරීමට හා දඩ මුදල් අයකිරීමට කටයුතු කර ඇති බව. | ආදේශක සැපයීමේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, භටපිරිස්වල පෝෂණය මෙන්ම ඔවුන්ගේ රුචිකත්වය පිළිබඳවද අවධානය යොමුකළ යුතු වීම. |
| (ඇ) | රු.මිලියන 6.06 ක වියදමින් කවර්ස් අවුටර් 250 ක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන කටයුතු නිසි කාලරාමුවක් මත සැලසුම් නොකිරීම හේතුවෙන් නැවත වරක් ලංසු කැඳවීමටත් එක් ලංසුකරුවකුගේ මිල ගණන් මත මිලදී ගැනීමටත් සිදු වී තිබුණි. තවද, මාස හයකට ආසන්න කාලයක් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී තිබුණු අතර, පළමු අවස්ථාවේ තරඟකාරීත්වය මත ලබා ගත හැකිව තිබුණු මිල වාසියද ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අසම්පූර්ණ ලංසු ආයතන වෙතින් ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම ලිපිගොණුවට අදාල ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වී ඇති බව. | ප්‍රසම්පාදනයන් මනා ලෙස සැලසුම් කළ යුතු අතර, කලට වේලාවට, භාණ්ඩ හා සේවා ලබාගත හැකිවන පරිදි රජයට වඩා වාසිදායක ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදු කළයුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) සාමසාධක රාජකාරී සඳහා මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට නියමිත 685 ක හට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුලදී මිලදී ගෙන තිබුණු අතර, මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් රු. බිලියන 1.38 ක් වටිනා ප්‍රවාහන හා උපකරණ තොග විවිධ ප්‍රදේශවල ප්‍රධාන ගබඩා කිහිපයක ගබඩා කර තිබුණි. මෙම තොග වලින් 2016 වර්ෂයේ මිලදී ගන්නා ලදුව, 2021 මැයි සහ අගෝස්තු මාස අතර කාලයේදී, කල් ඉකුත්වන වාහන පින්තාරු කිරීමට යොදා ගන්නා රු.මිලියන 1.07 ක් වටිනා තීන්ත ලීටර් 924 ක් පරිහරණය කිරීමට නුසුදුසු තත්ත්වයක පැවතුණි. දිවයිනේ තවත් ස්ථාන කිහිපයක සාම සාධක රාජකාරී සඳහා මිලදී ගන්නා ලද වටිනාකම් අනාවරණය නොකෙරුණු වාහන හා උපකරණ තොග නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | අවබෝධතා ගිවිසුම අනුව ස්ථානගත කළ යුතු භාණ්ඩ හා උපකරණ සංඛ්‍යාව ස්ථානගත කර ඇති අතර, හට පිරිස් වැඩි කිරීමේදී තවදුරටත් මාලි රාජ්‍ය වෙත යැවීම සඳහා මිලදීගෙන රඳවා තබාගෙන ඇති භාණ්ඩ/උපකරණ හා වාහන සම්බන්ධව අදාල ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලබන බව. | අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන කළයුතු අතර, මේ වන විටත් මිලදීගෙන ඇති මෙම ප්‍රවාහන හා උපකරණ තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළයුතු විම. |

## 3.3 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------------- | ------------ |
| යුධ සමයේ ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කර ගත් වාහන 539 ක නීත්‍යානුකූල අයිතිය යුද්ධ හමුදාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, යුද්ධ හමුදාවට අයිති වාහන 5,534 ක් සඳහා රක්ෂණාවරණ ලබා ගෙන නොතිබුණි. | ධාවන තත්ත්වයේ පවතින වාහනවල අයිතිය පවරා ගැනීමටත්, යුද්ධ හමුදාවට අයිති වාහන සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරන බව. | අත්පත් කරගත් වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනිමටත්, රක්ෂණය කර නොමැති වාහන සඳහා රක්ෂණාවරණ ලබාගැනීමටත් කටයුතු යුතු වීම. |

## 3.4 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | --------------------------- | ----------- |
| (අ) අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 10.1 ඡේදයේ මාර්ගෝපදේශයන් ප්‍රකාරව අදාල | | |

| | | | |
|---|---|---|---|
| | ආකෘතිපත්‍රවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන සමඟ සටහන (i) සහ (ii) වශයෙන් ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් ප්‍රකාශ හා පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශයන් පහත අඩුපාඩු සහිතව පිළියෙල කර තිබුණි. | | |
| **(i)** | සාලාව යුධ හමුදා කඳවුරේ ගාල් කර තිබියදී, පිපිරීමක් නිසා විනාශ වූ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දුන් වාහන 62 කට අදාල රු.මිලියන 746.34 ක අලාභහානි තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාදුන් මෙම වාහන තොග ගතකර හෝ එහි වටිනාකම් යුද්ධ හමුදාව තුළ ගිණුම්ගතකර නොමැති බව. | යුද්ධ හමුදාවට අයිති දේපලවලට සිදුවන හානී පමණක් පාඩු හෝ අත්හැරීම් ලෙස හඳුනාගත යුතු වීම. |
| **(ii)** | 1987 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදුවූ නමුත් වර්ෂය තුළ කපා නොහල හානි හා අලාභහානි සම්බන්ධයෙන් තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ කපාහල හානි හා පාඩු පිළිබඳ තොරතුරු පමණක් ඇතුලත් කර ඇති බව. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට ලබා දී ඇති මාර්ගෝපදේශයන් හා ආකෘතිපත්‍ර ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කළයුතු වීම. |
| **(iii)** | 2017, 2018, 2019 වර්ෂ වල යුද්ධ හමුදාවේ වාහන 222 කට සිදුවුනු අනතුරු වලින් තවදුරටත් අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳව පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෝ පොත් වලින් කපා හැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෝ අනාවරණය කර නොතිබුණි. මෙම වාහන 222 න් වාහන 155 ක් සඳහා තක්සේරු කළ අලාභය රු.මිලියන 110.4 ක් වූ අතර, වාහන 67 කට අදාලව අලාභය තක්සේරු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රිය අනතුරු 63 කින් සිදු වූ අලාභහානි වලින් මෙතෙක් හානි ලෙස හඳුනා ගත් අලාභහානි සහ 1990 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාහන අනතුරු 465 කට රිය අනතුරුවලින් සිදු වූ හානි පිළිබඳ තොරතුරු ද, මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි. | වාහන අනතුරු 67 ට අදාළ මූලික පරීක්ෂණ උසාවි කටයුතු සිදුකරමින් පවතින බැවින් දළ ඇස්තමේන්තු වාර්තා නිකුත් කර නොතිබුණු අතර, පොත්වලින් කපාහැරීමට කටයුතු කිරීමට සැළකිය යුතු දීර්ඝ කාලයක් ගත වේ. එබැවින් රිය අනතුරු 63 ට අදාලව අලාභ හානි දක්වා නොතිබුණි. 2021 වර්ෂයේ සිට අදාළ හානි හා පාඩු ලේඛනය සකස්කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | වාහන වලට සිදු වී ඇති අලාභහානී මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ආකෘතිපත්‍ර වලින් හෙළිදරව් කළයුතු වීම හා මෙතෙක් තක්සේරුකර නොමැති වාහන අලාභහානි කඩිනමින් තක්සේරු කළයුතු වීම. |
| **(ආ)** | 1992 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා යුද්ධ හමුදාවේ ගබඩාවල භාණ්ඩ, අවි ආයුධ හා උපකරණ අස්ථානගතවීම, මෝටර් රථ ගිනි ගෙන විනාශවීම හා ත්‍රස්තවාදී ප්‍රහාරවලින් සිදු වූ හානි ඇතුලුව විවිධ වත්කම් වලට සිදුවූ රු.මිලියන 15.69 ක අලාභහානි 17 | යුද්ධ හමුදාවේ විවිධ වත්කම් සඳහා සිදුවූ හානි 17 සම්බන්ධව පරීක්ෂණ කටයුතු නිම කිරීමෙන් පසු ඊට අදාළ යුද්ධ | අදාල අලාභහානි සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ක් සම්බන්ධව ක්‍රියාමාර්ග යුද්ධ හමුදාධිපති නිගමන ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු අතර, එම අලාභහානි සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හමුදාධිපති නිගමන ලබාගැනීම සඳහා නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අවශ්‍ය ඉදිරි කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. | |
| (ඇ) | 1987 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා යුද්ධ හමුදාවේ ගබඩා ගිනි ගැනීම්, මාලි රාජ්‍යයේ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් සිදු වූ අලාභහානි, ගබඩා භාණ්ඩ හා උපකරණ අස්ථානගත වීම, විවිධ ත්‍රස්ත ප්‍රහාර හේතුවෙන් ආයුධ, උපකරණ හා වාහනවලට සිදුවූ විවිධ අලාභහානි හා යුද්ධ හමුදා වාහනවලට සිදු වූ අලාභහානි ඇතුළු විවිධ වත්කම් වලට සිදුවූ අලාභහානි 35 කට අදාලව එකතුව රු.මිලියන 85.48 ක අලාභහානි සඳහා ක්‍රියාමාර්ග ගැනීමට මූලික පරීක්ෂණ උසාවි වෙත ඉදිරිපත් කර තිබුණු අතර, එම අලාභහානි සම්බන්ධවද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ මූලික පරීක්ෂණ උසාවි කටයුතු සිදුකරමින් පවතින අතර, කඩිනමින් නිම කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාල අලාභහානි සම්බන්ධයෙන් නඩු විභාග කඩිනම් කර ක්‍රියාමාර්ග ගැනීම වේගවත් කළයුතු විම. |

**3.5 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ------------ |
| (අ) | වේරහැර ප්‍රදේශයේ යුද්ධ හමුදා ඖෂධ ගබඩාවක් ස්ථාපිත කර තිබුණු අතර, මෙම ගොඩනැගිල්ල ඖෂධ ගබඩා කිරීම සඳහා තිබිය යුතු ප්‍රමිතීන් අනුව සකස් කර නොතිබුණි. ආරක්ෂිත කැමරා පද්ධතියක්ද සවිකර නොතිබුණි. covid – 19 රෝගය වලක්වා ගැනීමට අවශ්‍ය රු.මිලියන 45.6 ක් වටිනා විවිධ වෛද්‍ය අයිතමයන්, එතනෝල් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙම ගොඩනැගිල්ලේ තරප්පුපෙළෙහි සහ ඉහළ මහලයේ කොරිඩෝවේ අවිධිමත්ව ගබඩා කර තිබුණි. වැසි දිනවලදී මෙම ගබඩා ද්‍රව්‍යයන් තුළට වැසි ජලය ගලා ඒමේ අවධානමක් පැවතුණි. ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩාවක් මෙම පරිශ්‍රයේම ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ඉඩ පහසුකම් නොමැති විම නිසා වෛද්‍ය ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක ද්‍රව්‍යන් ගබඩාවෙන් පිටත ගබඩාකර ඇත. යුද්ධ හමුදාව සතුව සුදුසු නව ගොඩනැගිල්ලක් නොමැති විම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති අතර, මූලික බෙහෙත් ගබඩාව ස්ථාපිත කිරිම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් වේරහැර කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් පරිශ්‍රය් ඉදිකරිම සඳහා සැලසුම් සකස්කර ඇති බව. | සැලසුම් කළ ඖෂධ ගබඩා ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකිරීමට පියවර ගතයුතු වීම සහ එතෙක් අදාල ඖෂධ හා වෛද්‍ය සැපයීම් ද්‍රව්‍ය වලට හානි නොවන ලෙස ගබඩා පවත්වා ගැනීමට කටයුතු කළයුතු විම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | යුධ හමුදා කඳවුරු සඳහා මාළු ගබඩා කිරීමට ප්‍රමාණවත් අධිශීතකරණ ලබා දීමට කටයුතු කර නොතිබුණි. | යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය අනුව අධිශීතකරණ ලබා දීමට කටයුතු සිදුකරමින් පවතින බව. | ප්‍රමාණවත් අධි ශීතකරණ පහසුකම් ලබා දීමට කටයුතු වීම. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | යුද්ධ හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක් හා තෘතියක හා ද්විතීක මට්ටමේ පුරප්පාඩු 83 ක් ඇතුළු සමස්ථ පුරප්පාඩු 1,469 ක් පැවතුණි. | අදාල පුරප්පාඩු පිරවීමට ඉදිරියේදී කටයුතු කරන බව. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සිවිල් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 9,650 දෙනෙකුට කිසිදු පුහුණුවක් ලබා දී නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පාඨමාලා සංවිධානය කිරීමට නොහැකි වූ බව. | සේවක පුහුණුව තුලින් කාර්යසාධනය ඉහල නංවා ගැනීමට කටයුතු කළයුතු වීම. |